Page 6 September 2008.qxd 18/09/2008 19:50 Page 1



# නිර්මාණ Nirmana



## දුර කතනය අතේ එක එක දේ හිතේ

දෙ ප සේ කැමැත්තෙන් දෙදෙනගෙ කැමැත් තෙන්
කැ ප වී සෙනෙහසට ආදර නිමිත් තෙන්
සැ ප හා දුකට එක තැන සිට දෙපැත් තෙන්
උ ප යා අත මිටද ගහ බැණ නොගත් තෙන්

ක වු රුත් ඇළුම් කළ එකමුතු යුවලක් වී
අ වු රුදු පහළොවක් යුග දිවියට එක් වී
මැ වි සුර ලොවකි දරු දෙදෙනා එළියක් වී
ගෙවි වා දවස ආදර මල් පොකුරක් වී

මෙතු වක් හොඳින් සිටියදි පෙම් සුවඳ බිබී
ස තු ටින් සෙල්පෝනයක් හොර රහසෙ තිබී
මි තු රියකගෙන් තුටු පඬුරක් විලස ලැබී
සි තු පැතු විලස බැලුවා ඇය එයට එබී

පෙම්බර හිමිතුමා අමතක වුනේය
කන්නට ගියත් දුරකතනය ගෙනේය
සංගීතය ඇහෙන විට එය කනේය
මංගල මුද්දටත් ඇගෙ හිත පෙනේය

කන් තෝරුවට යයි සැමියා උද යේම
නන් වයි වැන් රියකට දරු දෙදෙ නාම
සන් තෝසෙකි හිතට තනිකම හිතු වාම
දැන් නිදහසේ ඇත ඇය මුළු දව සේම

හ ඬ දෙයි වෙලාවට දුරකතනය ඇගේ
හැ ඬ වෙයි හොඳට ගමනක් යන්නට වාගේ
අ ඬ වල් කළ දොරකි බිබිය සැක දෙක නැගේ
ගොඩ වෙයි කෙනෙකු ගෙට හොර පූසෙකු වාගේ

හුර තල් කළ ළමුන් දෙදෙනෙකු ලැබෙන තුරු
වර දෙහි නොබැඳෙමින් පතිවත රැකෙන යුරු
සුර ලොව ගෙදර තිබු ආදර සුවඳ පෙරු
දුර කතනයෙන් පැනගියෙ ලෙස නොසිතු විරු

නි ව සම කිළුටු කර තහනම් රසය ලැබූ
ප ව පල දෙමින් දුරකතනයෙ ඇඟිලි එබූ
පැව රුණ නඩුවක්ය අද සැමියෙකුට අඹු
ඉ ව රයි පවුල් ජීවිතයම හොඳට තිබූ

♦ කිවිපති පාතකඩ කුලතිලක
මහරගම Sri Lanka

## දරු සුරතල් මහිම

උංගා ගයන හඬ ගෙයි හැම තැනම ඇසේ
කිරි සුවඳක් හමා යනවා මුළු නිවසේ
දිව රෑ දෙකම වැඩ පල කවුරුත් එකසේ
කිරිකැටි පැටව් දෙන්නෙක් ඉන්නව නිවසේ

දෙහදක මිහිර එක්තැන්වී බැඳුණ අත
යුග දිවි සැපය දරුවන් ලද විටදි ඇත
මව් පදවිය ලබා සතුටින් පිරුණු හිත
මගෙ දියණිය සිටිනු දැක පිබිදුනා සිත

මිහිරක් ලදිමි, මගෙ දුව දරුවන් දෙන්නා
මගෙ සැමියගෙයි, මාගෙයි දෝතට දුන්නා
පොඩි මල් කැකුළු ලෙස සිටියා උන් දෙන්නා
සම්පත සතුට අපගේ හද උතු රන්නා

කවි සීපද කතන්දරයක් පව සන්න
දරුවන් නිවුන් ආදරයෙන් නළ වන්න
මියයන්නට පෙරදි හුරතල් දැක ගන්න
තිබුණා පිනක් අපි දෙන්නට සැන සෙන්න

පුතුගේ පුතා දැන් පාසැල් යන වාය
දුවගේ දරු දෙදෙන හිස ඔසවන වාය
යුතුකම් ඉටු කළයි අපි සැනසෙන වාය
මේ ලෝ දහම කාටත් පොදු වෙන වාය

♦ ප්‍රේමා සුරවීර රූපසිංහ
East London UK

## ජනකවි

බස්සා නිදි මරයි ඌ කරන වැඩ නැතී
බල්ලා කපු කටියි ඌ වියන රෙදි නැතී
වඳුරා මහලු මුත් මිහිපිට නම් නොයතී
සිවලා සිංහ වෙස්ගත් පසුව රැවටෙතී

## සිරිලක වනරෝදක අසිරිය!

විසිරී තිබෙන මල්පෙති වැලි තලා මත
වැතිරී ගලායන ගඟ දෙස යොමා නෙත
හමනා මඳ නලින් සරතැස නිවා ගත
සිටිනා කෙනෙකුගේ සිත වෙයි සමා හිත

වනරොද පුරා රැව්දෙන සියොතුන්ගෙ නද
සුන්දර සිරින් පිරි දිය ඇලි කොමළ ළඳ
සල් සපු නා පනා නන් තුරු අතර වැද
ගිල් වයි සතුටු සයුරේ දුටු දනගෙ හද

පවතින නිසල බව එහි රුක් සෙවනැල්ලේ
ගෙන දෙයි සිතට අම සුවයක් සැනසිල්ලේ
තුරු මත රඟන සියොතුන් නිති විමසිල්ලේ
පල රස විඳිති ගයමින් ගී සිතු ලොල්ලේ

නිල් තණ බුදින මුව පොව්වන් ප්‍රියං කර
වෙන්වී නොයති වැඩි දුර මවගෙන් බැහැර
එහෙ මෙහෙ දුවන පනින සා පැටවුන් නිතර
වඩවයි තව තවත් වනරොද රැඳි මිහිර

තුරු අග පිපුණු සුදු කහ රතු කුසුම් වලින්
විහිදෙන සුවඳ පැතිරෙයි මඳ සුළං රොදින්
හැසිරෙන බඹර මීමැසි රොන් සොයා යමින්
පතුරන ගුම් හඬින් සිත් පිනවයි සතු ටින්

ලැබගනු පිණිස සැනසුම නිති හිත තවන
හොඳ කෙම්බිමකි කෙනෙකුට මේ වන අරණ
නිසලයි සිසිලසයි එහි මෙන් සඳ කිරණ
හැකිවෙයි බවුන් වඩනට ලැබ දෙන නිවන

♦ විශ්‍රාමලත් විදුහල්පතිනිය
ප්‍රේමා අදිකාරි
Morden, Surrey UK

## දියණිය සිහිපත්ව

ජීවන සුවඳ ගත සිත දැවටෙනු දැනිණ
කිරිකැටි බිළිඳියක හඬනා හඬ ඇසිණ
මා ලද මහඟු වස්තුව මා අත රැඳිණ
ඔබ ඉපදුනෙන් මට පිය පදවිය ලැබිණ

දෝතට රැගෙන හිස දෙකොපුල නළල සිඹ
පැහැගැන්වීය සම කෙරුමට ඉඳුණු අඹ
හිරු සඳු සේම සිරියාවයි යහන් ගැබ
අම්මා නොවුණ මුත් අම්මා කෙනෙකි ඔබ

උදයේ නැගිට මව්තුරුළේ කිරි බොනවා
සවසට මාත් සමගින් දොඩමලු වෙනවා
සෙල්ලම් කඩේ ගොස් නෙක බඩු ගෙන එනවා
වැලි බත් උයාගෙන කන්නට සැර සෙනවා

දුව පැන නටා දොරමුල්ලේ හැංගෙන් න
තුරුළට රැගෙන බෝනික්කෙකු නළවන් න
අම්මගෙ සාරි ගෙන ඉහවට දවටන් න
ඔබ හපනියෙකි කිචි බිචි ගා හිනැහෙන් න

පින්බර සිතින් සකසා පොල්තෙල් පහන
තෙරුවන් පිණිස බුදු කුටියට ගොස් පුදන
වැඩිහිටි නැසියන් වෙත නිති ගරු කරන
පිංකඳ ඔබයි නිවසට සැනසුම ගෙනෙන

කෙස් ගැට ලිහා කොණ්ඩය පීරා දෙකට
පොත් ටික තුරුළුකරගෙන පිරිපුන් ලැමට
පාසැල් ගොසින් මුල් තැනගෙන හැම වැඩට
දහසක් තෑගි ලැබුවා ඔබ ඇඟ බරට

බිළිඳිය කැකුළු වී ළඳකගෙ වෙස් ගන්නා
කවදා නමුත් කුලගෙයකට පිවි සෙන්නා
කට කිරි සුවඳ මගෙ ගත සිත දැව ටෙන්නා
සිහිනෙන් පවා නැළැවිලි ගී මුමු නන්නා

♦ මේජර් වී. බී. කරුණාරත්න
Oxford, UK

## හෙන්රි කල්දේරා



අප දකිනා ලොව විසිතුරු
අපට වඩා දැක නිසියුරු
ගැයූ ගීත නෙක අමයුරු
දෙසවන් පිනවූ සුමිතුරු

කෝකිලයාණෙනි සුමිහිරි
මැණිකකි හෙළ
බිමෙහි අසිරි
මිහිරි තනුවෙකිය රස පිරි
සිහිවෙයි කල්දේර හෙන්රි

කන විඳින වෙළේ
කඳුළු ගඟේ එතී
ඇය තාම ඔබහට
ආදරේ කියා නැතී
හිතවතෙකු මගේ
ඔබේ සුරත ගතී
සිහිවෙයි තත් තාර පැටිය නිතී

♦ රන්ජිත් විමලනාත්
Paris - France
ගායක හෙන්රි කල්දේරා මහතා සිහිවීම පිණිසය



## To serve our birth-land
### (A reminiscence)

Now hangs my passing gaze with comrades proud,
Softly rousing a fond brave strain, to stride
In gray of blue and khaki combat drill,
With bawl and leap and squeezed trigger-shot,
Across a shell-scarr'd point up lone tree hill
Breathless, on dappled, battle-stomping ground.
Relentless guidance blowing shrill to strive,
So oft we'd scale to peak in booted suns,
Suffer blind cloudburst, raging jungle tide;
Clammy we cheer in dank and bruised kit;
'Per ardua ad astra' bound as one,
To serve our birth-land tall through dusk and dawn.
Now, whisp'ring spinwheels sweep a home-vale hill
Where maiden rifles proved their aim until.

♦ **Wewage A M Dep**
Letchworth, Herts, **UK**
**(The writer is a Retired Air Force Officer)**



සයුරෙන් ගොඩබිමෙන්
හා උඩු ගුවන් කුස
පීරා හඹා ගොස්
වනසා රුපුන් විස
රකිනා රට වීර
දරු පරපුරක් දෙස
සතුටින් බලයි ලක්මව
පිසලමින් ඇස

♦ *DAREN* London NW3

## චින්තා

අහිංසක නෙතු විදා පා නගා පෙර මගින්
සොඳුරු මුව මඬල මුදු සිනාවෙන් සර සමින්
ජීවිතේ විරහ දුක් ගිනි නිවන මා සිතින්
දයා ගුණ සපිරි සිත සදා වාසනා වන්

කාලයේ පියාපත් ඉගිල ගිය මුත් සැනින්
අභිමි විය මා පැතු ආදරේ එක සිතින්
පලාගිය සෙනෙහසේ සිනා බිඳු ඇගෙ වතින්
ඇගේ පිළිරු අඳිමි ඔබේ හසකැන් මතින්

ඔබ තුරුණු යුවතියක වුව ද මා වියපත්ව
හමුවුනත් සසර මග මේ ලෙසින් හිතවත්ව
අතර මග රැඳෙන ඔබෙ සිනා වත සිහිපත්ව
ජීවිතේ ඇති තුරා හිඳිමි මම සුවපත්ව

♦ සන්ධ්‍යානි සේනාරත්න
Roehampton
London SW15

## පෘථග්ජන

මිනිස්සු
සරලබව නොදකිති
නොඅගයති
හුදු සංකීර්ණත්වය ම සොයති

පසු දොර නොවසති
ඉඳුරන් සතපවති
ශාන්තිය නැතැයි මොරදෙති

ගුණදම් සිඳිති
පිටු දකිති
කෙලෙස් බරින් මියැදී
නිර්වාණයම පතති

♦ ශ්‍රියා කුමාරසිංහ
New Zealand

## සදා නොවෙනස් නිමල සෙනෙහස

අඳුර පරදා නැගුණ සඳමල
නුඹයි ලෝකෙට එළිය දුන්
නුඹත් අහසකි දුකම උසුලන
කඳුළු අතරින් සිනහ දුන්

සදා නොවෙනස්
නිමල සෙනෙහස
නුඹයි දුන්නේ එක ලෙසින්
ලොවට ජීවය ලබා දෙන්නී
නුඹයි මිහිපිට නැත වෙනින්

දුකට සතුටට ළඟින් හිඳිනා
කෙනෙකු නැත ලොව නුඹ තරම්
සිතම සනසන එකම රුව නම්
නුඹයි අම්මා ලොව පිදුම්

♦ ප්‍රියංවදා ජයමාලි
මුවගම රත්නපුරය
Sri Lanka

## සක්සඳ සිහිවී

ගමේ සුවඳ මල් මුවරද තව රාන
මතක බසෙන් කොළඹට ආ මිතු රාන
ආපු ගමන් පිටවෙන්නට හැදු වාට
දැන්ම සිතින් මා සමුගන්නේ කෝම

ඇවිත් ගියත් නුඹ සිත් කුටියට රෑට
අඳුර තමයි තිබුණේ හඳ ඇති දාට
කාසි ගලන ටැප් එක පොඩි හිංදාම
ගමේ ඇලට දුවගෙන එන්නේ කෝම

මතක නියරෙ වක්කඩ කට කැඩුණාම
ගමට එන්න හිතෙනව මට හැමදාම
සාක්කුවට අත්දෙක දා බැලුවාම
නූල් බෝලයක් පැටලෙයි හැමදාම

♦ මහින්ද ප්‍රසාද් මස්ඉඹුල
ගොඩකවෙල Sri Lanka

## කිසිදා හැර නොයන රැළම් සිහින

මෙතුවක් කලක් ලක් අම්මට වද දුන්න
බයකර අපිව හැඳුවත් රට දෙක ඩන්න
රැළම් සිහින මැවුවත් බොරුවෙන් සැදුණ
නොදෙනෙමු ඉඩක් කොටියට හිස වන්න

ආවේ මෙහෙය කරනට සුද්දන්ට එදා
වතුවැඩ කළේ ජීවිත ගැටගසනු සදා
කල් යල් බලා හිඳ සටනට ආවෙ මෙදා
මොන උරුමයට මව්බිම ගන්නට ද බෙදා

තේ වතු රබර්වතු වල වැඩ කර මින්න
මතකද ගෙවූ කාලය ගැති පෙන්ව මින
ඒ ආ ගමන සිතිලා නැවතී ඉන්න
අද දත කනව ලක්බිම හිමි කර ගන්න

රැළම සිත මවන් මෙතුවක් කල් ගෙවලා
ලක් මැණිගේ වටිනා හැම දෙය කාලා
අතහැර යන්න ලොබවී එහි රස දැනිලා
අවසන් නොවන යුදයක් අද ඉතිරි කළා

කන්නට දුන්න අත සපනට තරම් කොටී
නොමදත් කෙලෙහිගුණ උන්ගේ ගතියෙ හැටී
අන්තිම හුස්ම තෙක් සිටියද සටනෙ වැටී
අඟලක් තොපිට නොදෙනෙමු රට අපට වටී

♦ විමලා යාපා
Nicosia Cyprus

## ඇතුළත හා පිටත

දුක් කම්කටොළු බාදක පිරි ජීවිත ය
කන්දක් උඩින් ගලනා දිය ඇල්ලක් ය
වේගෙන් හැපී විසිරෙන පිණි බිඳුවක් ය
හිතෙනව වඩා මරණය නම් සුන්දර ය

එන එන ගොබය සුලි සුළඟට බිඳ වැටෙන
යන එන මගියනගෙ දූවිලි පා ගැටෙන
ජීවිත අරටුවේ මුල් පහළට බහින
කල් මර මරා තව කුමටද මෙහි හිඳින

♦ වසන්තා කුමාරි දසනායක
මයිලවලාන කිරිඳිවැල Sri Lanka